

# අපෙන් අඹගහවැවට

කපිල චන්ද්‍රරත්න

සමාජයෙන් ඔබට ඉටුවියයුතු යුතුකම් ගැන සිතීමට පෙර ඔබෙන් සමාජයට ඉටුවියයුතු යුතුකම් ගැන සිතන්න යන අගනා කියමන අප ඔබ සැවොම අසා ඇතුවාට කිසිම සැකයක් නැත. නිදහස් අධ්‍යාපනයේ පල ප්‍රයෝජන ලත් ශ්‍රී ලාංකික අපට ඉහත කියමන වඩාත් අදාල බවයි අපගේ හැඟීම. ඊටත් වඩා පරෝපකාරය අපගේ සංස්කෘතිය තුළින් උරුමවූ අප අපට වඩා අඩු පහසුකම් ඇති අපේ මව් බිමේ ජනකොටස් වලට උදව් උපකාර කිරීම අධ්‍යාත්මික සතුටක් ගෙනෙන දෙයක් බව විශේෂයෙන් කිවයුතු නොවේ.

දැනට දස වසරකට පෙර ශ්‍රී ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයිය ආදි ශිෂ්‍ය සංගමයේ වික්ටෝරියානු ශාඛාව ඉතා උසස් කටයුත්තක් අරඹන ලදී. ඒ "කෑදෑව සංවර්ධන ව්‍යාපෘතිය" නමින් හඳුන්වන අනුරාධපුරයෙන් උතුරු දිශාවේ වූ ඉතා දුෂ්කර ගමක්වන කෑදෑව ග්‍රාමයේ ග්‍රාමීය රෝහලක් ඉදිකිරීමයි. එහිදී එම ව්‍යාපෘතිය ප්‍රජාමූල ව්‍යාපෘතියක් වශයෙන් ක්‍රියාත්මක විය. ප්‍රජාමූල ව්‍යාපෘති සංකල්පය මේ සඳහා යොදාගැනීමට අප සංගමය තීරණය කිරීමට මුලික වූ හේතු කාරණා කීපයක් විය. අඩු මුල්‍ය වියදමක් දැරීමට සිදුවීම, ඉදිකළ රෝහල ප්‍රදේශයේ ජනතාවට අයිතිබවක් හැඟීම, ඔවුන්ගේ ශ්‍රම දායකත්වයෙන් ඉදිවූ නිසා එය රැකගැනීමට පෙළඹීම. ඒ සැමටම වඩා දේශපාලනික, ආගමික ආදී විවිධ හේතුන් නිසා බෙදුනු ජනකොටස් ඒක රාශිව සුහදව සහයෝගයෙන් තම ගම නගාසිටුවීමට පෙලගැස්වීමට හැකිවීම. අප සංගමය විසින් ක්‍රියාත්මක කරන ලද කෑදැව ව්‍යාපෘතියේ මුල්ම අංගයෙන් ඉහත කී සෑම අරමුණක්ම ඉටුකරගැනීමට හැකිවීම පිළිබඳ අපි ඉතා නිහතමානී ආඩම්බරයකින් යුතුව සතුටු වෙමු.

රෝහල ඉදිකිරීමේදී අප ලද සාර්ථකත්වයත් ගමේ ජනතාවගෙන් ලැබුණු විවිධ ඉල්ලීමුත් නිසා තවදුරටත් කෑදැව සහ අවට ගම්මාන වලට උදව් උපකාර කිරීමට අපි තීරණය කලෙමු. එහිදී අප විශේෂයෙන් අවධානය යොමුකල ස්ථානය වුයේ ගමේ පාසලයි. බලධාරීන්ගේ අඩු අවධානයට යොමු වු කෑදැව විද්‍යාලයය ප්‍රමාණවත් පහසුකම් නොතිබු නොලැබු පාසලක් විය.

> ***අඹගහවැව ග්‍රාමයේ පෙර පාසලක් ඇතිමුත් ඔවුනට එම පෙරපාසල පවත්වාගෙන යාමට ස්ථිර වු ගොඩනැගිල්ලක් වර්තමානයේ නැත. වරෙක ගමේ පන්සලේ බණ මඩුවත් තවත් වරෙක පාසල්වත්තේ අඹ ගසක් යටත් පෙර පාසල පැවැත්වෙයි.***

ආර්ථික දුෂ්කරතා මැද ජීවත්වන ළමුන් විශාල පිරිසක් පැමිණෙන බැවින් මුලින්ම ඔවුනට අවශ්‍ය මුලික අවශ්‍යතා වන අභ්‍යාස පොත් පෑන් පැන්සල් පුස්තකාලයට අවශ්‍ය පොත් ආදිය සැපයුවෙමු. ඉන් අනතුරුව පාසලට අංග සම්පුර්ණ පරිගණක ඒකකයක් ලබාදී නවීන ලෝකය පිළිබඳ හැඳෑරීමට ළමුන්ට දොරටු විවර කළෙමු. පහවසර ශිෂ්‍යත්ව පංතියට අවශ්‍ය සියළු පහසුකම් හා ළමුනට අභ්‍යාස ප්‍රශ්න පත්‍ර මුද්‍රණයට අවශ්‍ය රෝනියෝ යන්ත්‍රයක්ද ලබාදීමු. ඊට අමතරව ක්‍රීඩා උපකරණ, ක්‍රීඩා කඳවුරු, සංගීත උපකරණ ආදී නොයෙක් දෑ ලබාදීම මඟින් ළමුන්ගේ විවිධ හැකියා වර්ධනයට අවශ්‍ය ඉඩකඩ ලබා දෙන ලදී. මේ වන විට රඹෑව අධ්‍යාපන කොට්ඨාශයේ ආදර්ශමත් පාසලක් බවට කෑදැව පාසල පත්ව ඇත.

විටින් විට අප එම ගම්ප්‍රදේශ වලට ගිය අවස්ථාවන් හිදී කටුමැටි බිත්තියක්වත් නැති ලී කණු සතරක් සිටුවා වහලයට පොල් අතු සෙවිලි කර ඉටිරෙදි ගෝනි කැබලි ආදියෙන් වටවූ නිවාස වල වෙසෙන පවුල් දැකගත හැකි විය. එදිනෙදා කුලීවැඩක්කර ජීවත්වන එවැනි පවුල් සහ ඔවුන්ගේ දරුවන් දැකීමත් හද සසල කරවන දෙයක්බව නොකිවමනාය. එවැනි පවුල් වලට නිවසක් තනාදීමත් අපගේ කෑදෑව සංවර්ධන ව්‍යාපෘතියට එක්වන ලදී.

මෙම කෑදෑව සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මකවීමේදී අප දුටු ගම දියුණුවීම ගමේ මිනිසුන්ගේ භේද අමතකකර ගම නගා සිටුවීමට එකට එකතුවීම ආදී හේතුන් නිසාත් ඕස්ට්‍රේලියාවේ ශ්‍රී ලාංකික ජන සමාජයෙන් ලද ඉතා යහපත් ප්‍රතිචාර නිසාත් එම ව්‍යාපෘතිය තවදුරටත් ව්‍යාප්ත කරමින් "කෑදැවෙන් ඔබ්බට" සංවර්ධන ව්‍යාපෘතිය මීට වසර කීපයකට පෙර අප සංගමය විසින් අරඹන ලදී. ඒ සඳහා අප තෝරාගත් ප්‍රදේශය වුයේ කෑදැවෙනුත් ඔබ්බට වු කැබිතිගොල්ලෑව ආසන්නයේ වු අඹගහවැව ගම්මානයයි. ව්‍යාපෘතියේ පෙර අධ්‍යයන කටයුතුවලට එම ප්‍රදේශයට ගියවිට අපගේ අවධානය මුලින්ම යොමුවුයේ අඹගහවැව පෙර පාසලටයි. රජයෙන් ලද එක් ගුරුවරියකුත් ස්වෙච්ඡා ගුරුවරියකුත් සිසුන් පහලොස් දෙනෙකුත් පමණක් සිටි එම පාසලට ඉතාම අවම පහසුකමක් වත් නොතිබිණි. එහිදී අප විසින් එම ළමුනට පාසල් පොත්, පාසල් බෑග්, පුස්තකාලයට අවශ්‍ය පොත්පත්, ක්‍රීඩා උපකරණ, මේස පුටු ආදිය සපයා දෙන ලදී.

ඊට අමතරව ආර්ථික දුෂ්කරතා ඇති ළමුන්ට ශිෂ්‍යත්ව ලබාදීම ස්වෙච්ඡා ගුරුවරියට මාසික දීමනාවක් ලබාදීමත් ක්‍රියාත්මක කරන ලදී.

අඹගහවැව ග්‍රාමයේ පෙර පාසලක් ඇතිමුත් ඔවුනට එම පෙරපා සල පවත්වාගෙන යාමට ස්ථිර ගොඩනැගිල්ලක් වර්තමානයේ නැත. වරෙක ගමේ පන්සලේ බණ මඩුවත් තවත් වරෙක පාසල්වත්තේ අඹ ගසක් යටත් පෙර පාසල පැවැත්වෙයි. අනාගතයේ ලොව ජය ගැනීමට සිටින ඒ අහිංසක දරුවනට ස්ථිර පෙර පාසල් ගොඩනැගිල්ලකුත්, එම ප්‍රදේශයේ ගැබිණි මව්වරුන්ගේ සායන මධ්‍යස්ථානයකුත් යන අයුරින් භාවිතාකළ හැකි ගොඩනැගිල්ලක් තනාදීමේ කර්තව්‍යයට අප සංගමය මේ වන විට මුලික පියවරගෙන ඇත. එහිදී වර්ග අඩි දෙදාහක් පමණ වන ගොඩනැගිල්ලක් රුපියල් ලක්ෂ පනහක පමණ වියදමින් ඉදිකිරීමට අප සංගමය බලාපොරොත්තුවේ.

ඉහත කී සියළුම ව්‍යාපෘතින් ලංකා ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනීය ආදිශිෂ්‍ය සංගමයේ වික්ටෝරියානු ශාඛාව විසින් දියත් කළ ද ඒ සඳහා මොරටුව ජර්මානු කාර්මික අභ්‍යාස ආයතනයත් ඕස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකික ජන සමාජයත් ලබාදෙන සහය අතිවිශාල බව කිවයුතුමය. විශේෂයෙන්ම අප සංගමයේ සාමාජිකයින් නොවන ඕස්ට්‍රේලියාවේ වෙසෙන ශ්‍රී ලාංකික ජනතාව ලබාදෙන මුල්‍යමය, ද්‍රව්‍යමය ආදී නොයෙකුත් සහායන් විශේෂයෙන් අගය කළ යුතුමය. අප විසින් ඉහත දැක්වූ ව්‍යාපෘති සඳහා අරමුදල් රැස්කිරීමට මෙහිදී පවත්වන්නාවු විවිධ වැඩසටහන් වල ඔවුන් ලබාදෙන සහයෝගය හා උපකාරයන්ට අපි විශේෂයෙන් තුති පුදකර සිටිමු.

